# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,351 - 2023 සැප්තැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.09.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 1040 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 1041 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


*සැ. යු.-* (i) සුසරණ ලංකා පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත, 2023 සැප්තැම්බර් මස 08 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

(ii) මාර්ගගත ක්‍රමවල සුරක්ෂිතභාවය පිළිබඳ පනත් කෙටුම්පත, 2023 සැප්තැම්බර් මස 15 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2023 ඔක්තෝබර් මස 13 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 සැප්තැම්බර් මස 27 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

1039 - B 082498 — 5,403 (2023/09)
F 1 -

# පළාත් සභා නිවේදන

## මධ්‍යම පළාත් සභාව - ප්‍රවාහන දෙපාර්තමේන්තුව

### යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා සුදුසුකම්ලත් ගරාජ අනුමත කිරීම - 2024 වර්ෂය

මධ්‍යම පළාත තුළ ලියාපදිංචිකර ඇති වෙළඳ වාහන සඳහා 2024 වර්ෂයට යෝග්‍යතා සහතික නිකුත් කිරීමේ කාර්ය ඉටු කිරීම පිණිස ව්‍යාපාරයක් වශයෙන් ලියාපදිංචි වී ඇති සහ අදාළ බදු ගෙවීම් පිළිබඳ සාක්ෂි ඉදිරිපත් කළ හැකි ගරාජ හිමියන්ගෙන් හා ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයට අයත් ඩිපෝවලින් අයදුම්පත් කැඳවනු ලැබේ. මේ සඳහා මධ්‍යම පළාත තුළ පිහිටා ඇති ගරාජවලින් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. අයදුම්කරුවන් විසින් පහත සඳහන් සුදුසුකම් සපුරා තිබිය යුතුය.

i. *පහසුකම් :-*

(අ) අඩි 20ක් දිග අඩි 2 1/2ක් පළල අඩි 4 1/2ක් ගැඹුරැති වාහන පරීක්ෂා කිරීමේ වලක් හෝ සමාන පහසුකම් සැපයෙන පරීක්ෂණ වේදිකාවක් හෝ ඔසවනයක්

(ආ) තිරිංග පරීක්ෂා කිරීමේ උපකරණ

(ඇ) ප්‍රධාන ලාම්පු පරීක්ෂා කිරීමේ උපකරණ

(ඈ) වාහනයේ යට කොටස, සුක්කානම් සන්ධි, තිරිංග, කේබල් ආදිය සහ දිරාගිය කොටස් පරීක්ෂා කිරීමට උපයෝගි කරගනු ලබන ඉස්කුරුප්පු නියන් ද, ස්පැනර්, මිටි ආදී යාන්ත්‍රික මෙවලම්

ii. *සේවක මණ්ඩලය.-*

සහතික කිරීමේ නිලධාරින් වශයෙන් පහත දක්වෙන සුදුසුකම්වලින් යුත් පුද්ගලයින් ගරාජයේ සේවය සඳහා යොදවනු ලැබ සිටිය යුතු ය.

(අ) මෝටර් වාහන ඉංජිනේරු විද්‍යා විෂය පිළිබඳව විශේෂ ප්‍රාගුණ්‍යයකින් යුතුව හෝ යාන්ත්‍රික ඉංජිනේරු විද්‍යාව පිළිබඳව ජාතික තාක්ෂණික ඩිප්ලෝමා සහතිකය හෝ කණිෂ්ඨ කාර්මික නිලධාරි සහතිකය ලබා මෝටර් වාහන ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි වර්ෂ පහක (05) ක පළපුරුද්දක් ලබා තිබීම.

(ආ) මොරටු ලංකා ජර්මානු තාක්ෂණික අභ්‍යාස ආයතනයේ මෝටර් යාන්ත්‍ර විද්‍යාව පිළිබඳව සිව් අවුරුදු පාඨමාලාව හදරා සමත්ව තිබීම හෝ වෙනත් සමාන සුදුසුකම් සහිතව මෝටර් වාහන ඉංජිනේරු ක්ෂේත්‍රයෙහි වර්ෂ අටක (08) ක පළපුරුද්දක් ලබා තිබීම.

02. අයදුම්පත සමඟ පහත සඳහන් ලියකියවිලි ඉදිරිපත් කළ යුතු ය.

(අ) සහතික කිරීමේ නිලධාරීන්ගේ සුදුසුකම් දක්වෙන සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත්,

(ආ) රු. 2,000 ක ආපසු නොගෙවන තැන්පතු මුදලක් 'ලංකා බැංකුවේ, අංක 33965, ප්‍රවාහන කොමසාරිස්, මධ්‍යම පළාත' ගිණුමට බැර කරන ලද බැංකු රිසිට්පතක්,

(ඇ) පරීක්ෂණ නිලධාරියාට ළඟාවිය හැකි පරිදි ගරාජය පිහිටා ඇති ස්ථානය නිශ්චිතව පෙන්නුම් කරන හා නගර මධ්‍යයේ සිට එම ස්ථානයට ළඟාවිය හැකි මාර්ගය දක්වෙන දළ සිතියමක් (මාර්ග විස්තරය කෙටියෙන්)

03. eRL 2.0 වැඩසටහන යටතේ වාහන ආදායම් බලපත්‍ර නිකුත් කිරීමේ දී යෙදවුම් මෘදුකාංගය හරහා පවත්වනු ලබන පරීක්ෂණවල විස්තර සහ ඡායාරූප උඩුගත කිරීම සඳහා ස්මාර්ට් දුරකථනයක් අවශ්‍ය වනු ඇත. එහෙයින් 2024 වර්ෂයේ සිට යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ ලියාපදිංචි කිරීමේ දී ස්මාර්ට් දුරකථනයක් තිබීම අනිවාර්ය අංගයක් ලෙස සලකනු ලැබේ.

* අදාළ අයදුම්පත් සතියේ වැඩ කරන දිනවල මෙම කාර්යාලයෙන් ලබාගත හැක.

අයදුම්පත බහා එවනු ලබන කවරයේ වම් පස ඉහළ කෙළවර ''**යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජ ලියාපදිංචි කිරීම 2024**'' යනුවෙන් සඳහන් කර, ප්‍රවාහන කොමසාරිස්, ප්‍රවාහන දෙපාර්තමේන්තුව, අංක 104, යටිනුවර වීදිය, මහනුවර යන ලිපිනයට **2023**

ඔක්තෝබර් මස 10 දින හෝ ඊට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු අතර, එදිනට පසුව ලැබෙන කිසිදු අයදුම්පතක් පිළිබඳව සළකා බලනු නොලැබේ.

ටී. එම්. පී. එස්. බී. තෙන්නකෝන්,
ප්‍රවාහන කොමසාරිස්,
ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
මධ්‍යම පළාත.

මධ්‍යම පළාත් සභාව,
ප්‍රවාහන දෙපාර්තමේන්තුව,
තැ.පෙ. 104,
යටිනුවර වීදිය, මහනුවර.

09-323

---

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව

### බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහාවන විවෘත තරග විභාගය - 2023 (අදියර II)

බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ පුරප්පාඩු සඳහා බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහය ප්‍රකාරව ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීමට මෙම නිවේදනයේ සඳහන් පරිදි සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාතේ ස්ථිර පදිංචි උපාධිධාරීන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

01. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍ය විෂයයන් සඳහා පළාත් පදනම මත බඳවා ගැනීම සිදු කරන අතර පවතින ප්‍රතිපාදන හා සේවා අවශ්‍යතාවය මත බඳවා ගන්නා සංඛ්‍යාව තීරණය කරනු ලැබේ. ඉදිරියේ දී බඳවා ගැනීම් සම්බන්ධයෙන් ලැබෙන අනුමැතීන්ට යටත්ව 2025.12.31 දින වන තෙක් පවත්නා පුරප්පාඩු සඳහා මෙම විභාගය වලංගු වේ. මෙම තරග විභාගයේ ලකුණු සහ ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව, ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන්ගේ මුළු කුසලතාවයේ අනුපිළිවෙල මත බඳවා ගැනීම් කටයුතු සිදු කෙරේ.

02. *වැටුප් ක්‍රමය -*

මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය 2022.01.05 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016(iv) හි ජී-ඊ-1-2016 - ඒ දරන වැටුප් ඛණ්ඩයට අදාළ රු. 31,490 - 6x445 -7x525 -2x600 -රු. 39,035/= වේ. ඔබ මෙම වැටුප් පරිමාණයේ 14 පියවර වන රු.37,835/- වැටුප් තලයේ පිහිටවනු ලැබේ.

03. *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් -*

3.1 අධ්‍යාපන සුදුසුකම් -

i. ඉගැන්වීම් කාර්යයන් සඳහා පිළිගත් සුවිශේෂී කරන ලද ක්ෂේත්‍රවලට අයත්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක් මගින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයක් මගින් හෝ ප්‍රදානය කරනු ලැබූ උපලේඛන 01හි සඳහන් කර ඇති විෂයයන්ට අදාළ උපාධියක් ලබා තිබිය යුතුය. මෙම උපාධිය අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට පෙර වලංගු උපාධියක් විය යුතුය.

*සහ*

ii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයේ දෙවරකට නොවැඩි වාර ගණනක දී මව්බස සහ ගණිතය සඳහා සාමාර්ථයන් සහිතව සම්මාන තුනක් සමග විෂයයන් හයක් (06) සමත් වීම. (එක් වතාවක දී අවම වශයෙන් විෂයයන් පහක් (05) සමත් වී තිබිය යුතුය.)

*සහ*

iii. අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී එකවර විෂයයන් තුනක් (03) සහිත ව එම විභාගය සමත්ව තිබිය යුතුය.

***ඉතා වැදගත්*** : (ඉල්ලුම් පත්‍ර සම්පූර්ණ කිරීමේ දී සැළකිල්ලට ගත යුතුය. )

- ස්වකීය උපාධිය අනුව ඉල්ලුම් කළ හැකි විෂයයන් පිළිබඳව අයදුම්කරුවන් සැළකිලිමත් විය යුතු ය.
- උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් අනුව පමණක් අදාළ ගුරු පුරප්පාඩු සඳහා ඉල්ලුම් කළ හැකි ය.
- ඉල්ලුම් කළ හැක්කේ විෂයයන් තුනක් දක්වා පමණි.
- ඉල්ලුම් කළ විෂයයන් හා මාධ්‍යය කිසිදු හේතුවක් මත පසුව වෙනස් කිරීමට ඉඩ ලබා දෙනු නොලැබේ.

3.2 කායික හා මානසික යෝග්‍යතාවය -

සෑම අපේක්ෂකයෙකු ම ගුරුවරයෙකු වශයෙන් රාජකාරි ඉටු කිරීමට සරිලන මානසික සහ ශාරීරික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

3.3 වයස -

අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 35ට නොවැඩි විය යුතුය.

3.4 වෙනත් සුදුසුකම් -

i. අයදුම්කරු/අයදුම්කාරිය ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
ii. අයදුම්කරු/අයදුම්කාරිය විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
iii. බස්නාහිර පළාතේ ඕනෑම ප්‍රදේශයක සේවය කළ හැකි විය යුතු ය.
iv. පුරප්පාඩු සඳහා ඉල්ලුම් කරන අයදුම්කරු හෝ කලත්‍රයා, අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර අඛණ්ඩ පදිංචිකරුවන් විය යුතු ය. (ග්‍රාම නිලධාරි විසින් නිකුත් කරන ලද පදිංචිය පිළිබඳ සහතිකය (ඩී.එස්.04) මඟින් සම්මුඛ පරීක්ෂණ අවස්ථාවේ දී පදිංචිය සනාථ කළ යුතුය)

04. *සේවා කොන්දේසි* -

i. රාජ්‍ය/පළාත් සභා රාජ්‍ය සේවා පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ පනවා ඇති කොන්දේසිවලට ද, එම ව්‍යවස්ථාවට කර ඇති හෝ මින් මතුවට කෙරෙන හෝ සංශෝධනවලට ද, යටත් ව තෝරාගනු ලබන උපාධිධාරී අපේක්ෂකයින් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට පත් කරනු ලැබේ.

ii. මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. මෙම තනතුරට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේ දී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට පත්වීම්ලාභීන් යටත් විය යුතු ය.

iii. මෙම තනතුරට පත් කරනු ලබන්නන් අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.

iv. බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයට අනුව උසස්වීම් සිදු කරනු ලැබේ.

v. 2020.10.16 දිනැති රා.ප.ච.18/2020 හා එයට වරින් වර සිදු කරන සංශෝධනයන්ට අනුව නියම කර ඇති පරිදි දෙවෙනි රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවය ලබා ගත යුතු ය.

05. *බඳවා ගැනීම* -

5.1 බඳවා ගැනීමේ ක්‍රමය :

2008.07.01 දින සිට ක්‍රියාත්මක බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ ශ්‍රී ලංකා ගුරු සේවා ව්‍යවස්ථා සංග්‍රහයේ 7.2.4 වගන්තිය අනුව බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

තෝරාගැනීම් සඳහා ලිඛිත තරග විභාගයක් පැවැත්වේ.

ලිඛිත තරග විභාගයේ ඉහළම ලකුණු ලබා ගත් අයගේ අනුපිළිවෙල අනුව ඒ ඒ විෂයයට පළාත තුළ පවතින ගුරු පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් (03) ගුණයක් සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයෙන් සුදුසුකම් ලබන අයදුම්කරුවන් පසුව ප්‍රායෝගික පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත තරග විභාගයේ ලකුණු හා ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල එකතුව අනුව ඉහළම ලකුණු ලබා ගත් අයදුම්කරුවන් පවතින පුරප්පාඩු සඳහා තෝරා ගනු ලැබේ. (ගුරු සේවා ව්‍යවස්ථාවේ 7.2.4.3.1 වගන්තිය බලපැවැත්වේ.)

5.2 ලිඛිත තරග විභාගය - මෙම විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| *විෂයය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සුදුසුකම් ලැබීමට අවශ්‍ය අවම ලකුණු ප්‍රමාණය* |
|---|---|---|
| 01. අභියෝග්‍යතා පරීක්ෂණය (කාලය පැය 01 යි) | 100 | 40 |
| 02. සාමාන්‍ය දැනීම (කාලය පැය 01 යි) | 100 | 40 |

*විෂය නිර්දේශය :*

විෂය අංක 01 - අභියෝග්‍යතා පරීක්ෂණය

අපේක්ෂකයා සතු ගුරු වෘත්තිය සඳහා වන කුසලතා, තර්කානුකූල බුද්ධිය පිළිබඳ දැනුම මැන බැලීම අරමුණු කොට ගෙන මෙම ප්‍රශ්න පත්‍රය සකසනු ලැබේ. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්න 50කින් සමන්විතය. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතුය.

විෂය අංක 02 - සාමාන්‍ය දැනීම

ගුරු ක්ෂේත්‍රයට අදාළ ව එම ක්ෂේත්‍රය පිළිබඳව ඇති සාමාන්‍ය දැනුම හා/හෝ දේශීය වශයෙන් සිදුවී ඇති හා සිදුවන අධ්‍යාපන ප්‍රවණතා පිළිබඳ සාමාන්‍ය දැනුම හා අධ්‍යාපන නවීකරණය පිළිබඳ සාමාන්‍ය දැනුම පරීක්ෂා කෙරෙන බහුවරණ හා කෙටි පිළිතුරු මාදිලියේ ප්‍රශ්නවලින් සමන්විත වේ. එම ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

5.3 විභාග පරිපාටිය -

i. මෙම විභාගය සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පැවැත්වේ.
ii. සෑම අපේක්ෂකයෙකු ම මෙම විභාගයේ සියලුම ප්‍රශ්න පත්‍රවලට පෙනී සිටිය යුත්තේ එක් භාෂා මාධ්‍යයකිනි. එම භාෂා මාධ්‍යය සිය පත්වීම් ලැබීමට නියමිත භාෂා මාධ්‍යයම විය යුතුය.
iii. අපේක්ෂකයෙකුට ස්වකීය අයදුම්පතෙහි දැක්වෙන භාෂා මාධ්‍යය පසුව වෙනස් කිරීමට අවසර දෙනු නොලැබේ.
iv. සෑම අපේක්ෂකයෙකු ම ප්‍රශ්න පත්‍ර දෙකටම (02) පෙනී සිටිය යුතු ය.
v. වරක දී බඳවා ගනු ලබන සංඛ්‍යාව පත්වීම් බලධාරියා විසින් තීරණය කරනු ලැබේ.

5.4 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය -

සේවා ව්‍යවස්ථාව හා ඊට අනුකූලව ප්‍රසිද්ධ කරනු ලබන *ගැසට්* නිවේදනයේ හෝ පුවත්පත් දැන්වීමේ හෝ වෙබ් අඩවියේ දැන්වීමේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම සහ කායික සුදුසුකම් පරීක්ෂා කිරීම.

5.5 ප්‍රායෝගික පරීක්ෂණය -

ප්‍රායෝගික පරීක්ෂණය වශයෙන් අයදුම්කරු විසින් හඳුනාගන්නා ලද මාතෘකාවක් යටතේ ඉදිරිපත් කිරීමක් කළ යුතුය. මේ සඳහා පහත සඳහන් පරිදි ලකුණු හිමි වේ.

| *අනු අංකය* | *ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | අරමුණ හා ප්‍රවිශ්ට වීම. | 05 | 02 |
| 02 | පෞරුෂය හා හඬ පාලනය. | 05 | 02 |

| අනු අංකය | ප්‍රායෝගික පරීක්ෂණයේ දී ලකුණු ලබා දෙනු ලබන නිර්ණායක | උපරිම ලකුණු ප්‍රමාණය | සමත් වීමට අවශ්‍ය ලකුණු ප්‍රමාණය |
|---|---|---|---|
| 03 | සන්නිවේදනයේ පැහැදිලි බව. | 05 | 02 |
| 04 | කාල කළමනාකරණය. | 05 | 02 |
| 05 | ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය. | 05 | 02 |
| | මුළු ලකුණු ප්‍රමාණය. | 25 | |

5.6 ප්‍රායෝගික පරීක්ෂණ ක්‍රමවේදය -

i. ප්‍රායෝගික පරීක්ෂණය සඳහා විනාඩි 05කට නොඅඩු කාලයක් ලබා දෙනු ලැබේ.
ii. ප්‍රායෝගික පරීක්ෂණය ලබා ගත හැකි උපරිම ලකුණු ප්‍රමාණය විසි පහකි (25).
iii. ප්‍රායෝගික පරීක්ෂණය සමත් වීම සඳහා එක් එක් නිර්ණායක සඳහා අවම වශයෙන් ලකුණු 2 බැගින් ලබා ගත යුතුය.
iv. ප්‍රායෝගික පරීක්ෂණයේ ඇගයීම බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලබන සම්මුඛ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කරනු ලැබේ.

5.7 නිර්ණායකයන්හි අරමුණ -

i. **අරමුණ හා ප්‍රවිශ්ට වීම.**
සාර්ථකව පාඩමෙහි අරමුණ පැහැදිලි කිරීම හා පාඩමට ප්‍රවිශ්ට වීමේ හැකියාව ඇගයීම.

ii. **පෞරුෂය හා හඬ පාලනය.**
ගුරුවරයෙකු ලෙස මනා පෞරුෂයකින් යුතු වීම හා ඉගැන්වීමේ දී මනා ලෙස හඬ පාලනය කිරීමේ ඇති හැකියාව ඇගයීම.

iii. **සන්නිවේදනයේ පැහැදිලි බව.**
ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී අදාළ කරුණු ඵලදායි ලෙස සන්නිවේදනය කිරීමේ හැකියාව ඇගයීම.

iv. **කාල කළමනාකරණය**
ලබා දෙනු ලබන කාල සීමාව තුළ අරමුණ කෙරෙහි ළඟා වීමේ කුසලතාවය ඇගයීම.

v. **ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම භාවිතය**
අරමුණ කෙරෙහි ළඟා වීම සඳහා ඉදිරිපත් කිරීමේ ශිල්ප ක්‍රම මනා ලෙස භාවිතා කිරීමේ හැකියාව.

06. විභාග ගාස්තු -

විභාග ගාස්තු ලෙස රු. 1,200/-ක මුදලක් බස්නාහිර පළාත් ආදායම් ශීර්ෂ අංක 20-03-02-99ට බැර වන පරිදි බස්නාහිර පළාතේ පිහිටි ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවීම් කර තමා නමින් ලබා ගත් බ.ප. 01 කුවිතාන්සියේ මුල් පිටපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ අලවා ඉදිරිපත් කළ යුතුය.

<u>බ.ප. 01 ආකෘතියේ</u> මුල් කුවිතාන්සිය හැර වෙනත් ආයතනවලට මුදල් ගෙවා ලබා ගත් කුවිතාන්සි හා මුදල් ඇණවුම් හෝ මුදල් කිසිවක් භාරගනු නොලබන අතර එවැනි කුවිතාන්සි ඉදිරිපත් කරන අයදුම්කරුවන්ට විභාගය සඳහා ඉදිරිපත් වීමට ඉඩ නොදෙන බව ද කිසිඳු හේතුවක් මත ගෙවූ විභාග ගාස්තු ආපසු නොගෙවන බවද, එම ගාස්තු වෙනත් කවර හෝ විභාගයක් සඳහා මාරු කිරීමට ඉඩදෙනු නොලබන බව ද සැලකිය යුතුය. (මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළඟ තබා ගත යුතු ය.)

07. **අයදුම්කළ යුතු පිළිවෙල** -

i. සියලුම අයදුම්කරුවන් නියමිත විභාග ගාස්තු ගෙවීමෙන් අනතුරුව www.psc.wp.gov.lk යන අපගේ නිල වෙබ් අඩවියට පිවිස අදාළ තොරතුරු ඇතුළත් කර අයදුම්පත පුරවා යොමු කිරීමෙන් (submit) අනතුරුව අයදුම්පත්‍රය බාගත කිරීම සිදු කල හැකිය. අයදුම්පත පිරවීමේදී යොමු කර ඇති උපලේඛන 01 උපයෝගී කර ගත යුතු ය.

ii. මාර්ග ගත ක්‍රමය ඔස්සේ අයදුම්කර (Online) බාගත කර (Download) නොගන්නා ලද අයදුම්පත් හා පරිගණකය මඟින් සකස් කර මුද්‍රණය කර ගන්නා ලද අයදුම්පත් සියල්ල දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ.

iii. අසම්පූර්ණ ලෙස තොරතුරු යොමු කර ඇති අයදුම්පත්, මූලික සුදුසුකම් සපුරා නොමැති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කෙරේ. සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි ඡායාපිටපතක් අයදුම්කරු ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

iv. අයදුම් කරනු ලබන විෂයය, විෂයය සඳහා මනාප අනුපිළිවෙල පසුව වෙනස් කිරීමට කිසිසේත් ඉඩ දෙනු නොලබන අතර එක් අයදුම්කරුවකුට ඉදිරිපත් කළ හැක්කේ එක් අයදුම්පතක් පමණි.

අයදුම්පත සමඟ කිසිඳු සහතිකයක් අමුණා නොඑවිය යුතුය. මුදල් ගෙවීම කළ බවට කුවිතාන්සියේ මුල් පිටපත පමණක් අලවා එවිය යුතුය. (අමුණා එවීම නොකළ යුතුය.)

v. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම -

අයදුම්පතෙහි හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන සහතික කිරීමට බලයලත් අයකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතුය. අපේක්ෂකයාගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතීඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලය ලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ ගැසට් කළ තනතුරක් දරණ නිලධාරිවරයෙකු, රු.498,960/-ක් හෝ ඊට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ, පළාත් රාජ්‍ය සේවයේ හෝ මාණ්ඩලික ශ්‍රේණියේ ස්ථිර තනතුරක් දරන නිළධාරියෙකු, බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජ්‍ය කෙනෙකු හෝ යන අයවලුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරනු ලැබ තිබිය යුතුය.

දැනටමත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන්ගේ අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු මඟින් සහතික කරනු ලැබ තිබිය යුතු අතර, අයදුම්පත ආයතන ප්‍රධානියා මඟින් යොමු කළ යුතුය.

vi. මාර්ග ගත ක්‍රමය මඟින් (Online) අයදුම්පත් යොමු කළ හැකි අවසාන දිනය - **2023.10.09**

vii. **2023.10.09** දිනට පෙර මාර්ගගත ක්‍රමය මඟින් අයදුම් කිරීමෙන් පසු බාගත කරන ලද යොමු අංකය (Reference No.) සහිත අයදුම්පත්, **අයදුම්කරුගේ අත්සන සහිතව හා අත්සන සහතික කර ගැනීමෙන් අනතුරුව 2023.10.16** වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ පහත ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. මෙදිනට පසුව ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

ලේකම්,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
අංක 628, 10 වන මහළ, ජන ජය සිටි ගොඩනැගිල්ල,
නාවල පාර, රාජගිරිය.

අයදුම්පත බහා ඇති කවරයේ වම් පස ඉහළ කෙළවරේ පැහැදිලිව **"බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ගුරු තනතුරට උපාධිධාරීන් බඳවා ගැනීම - 2023"** යන්න සහ අයදුම්කරනු ලබන විෂයයන් සඳහන් කළ යුතු ය.

08. තැපෑලේ දී නැතිවන හෝ ප්‍රමාද වන අයදුම්පත් සම්බන්ධයෙන් කිසිදු පැමිණිල්ලක් භාර ගනු නොලබන අතර, ප්‍රමාද වී ලැබෙන අයදුම්පත් කිසිඳු අයුරකින් සලකා බලනු නොලැබේ.

09. මෙම විභාගය කල් දැමීම, අවලංගු කිරීම හෝ පැවැත්වීමෙන් පසු තෝරා ගැනීම/නොගැනීම හෝ පුරප්පාඩු සංඛ්‍යාව පිළිබඳව අවසන් තීරණය හා මෙම නිවේදනයෙන් ආවරණය නොවන වෙනත් කිසියම් කාරණයක් වෙතොත් ඒ පිළිබඳව තීරණය කිරීමේ අයිතිය ද බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුය.

10. අයදුම්පත්‍ර ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මඟින් පළ කරනු ඇත. එම නිවේදනය පළවී දින 07ක් හෝ ගතවූ පසුවත් විභාග ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබාගත් අයදුම්පතේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක්ද සමඟින් අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සියද අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදි ව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ විභාග අංශයෙන් විමසිය යුතුය.

11. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් සපුරා ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා අයදුම්පත මාර්ගගතව යොමු කර අයදුම්පතේ මුද්‍රිත පිටපත නිවැරදි ව සම්පූර්ණ කර එවා ඇති අයදුම්කරුවන් වෙත විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. අයදුම්කරුවෙකුට විභාග

ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට හෝ තනතුරක් දැරීමට සුදුසුකම් සපුරා ඇති බවට හෝ පිළිගැනීමක් ලෙස සළකනු නොලබන අතර, විභාගය සමත්වීමම පත්වීම ලැබීමට සුදුසුකමක් ලෙස සළකනු නොලැබේ. අයදුම්කරු සුදුසුකම් සම්පූර්ණ කර නොමැති බව අනාවරණය වන ඕනෑම අවස්ථාවක දී විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට හා පත්වීම් ලබාදීම ප්‍රතික්ෂේප කිරීමේ බලය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

12. මෙම නිවේදනයේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්වේ.

13. පත්වීම් ලිපියේ සඳහන් ව ඇති පත්වීම් දින සිට දින 14ක් ඇතුළත වැඩභාර ගැනීම සිදු කළ යුතු අතර, එසේ නොවුනහොත් නැවත දැනුම් දීමකින් තොරව පත්වීම අවලංගු වේ.

උපලේඛනය I

පුරප්පාඩු විෂයයන් හා මාධ්‍යයන් පහත දක්වා ඇත. ඒ අනුව ඉල්ලුම්කරනු ලබන විෂයය හා මාධ්‍ය තෝරා ගැනීම කළ යුතුය.

| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 1 | ප්‍රාථමික | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල/දෙමළ භාෂාව හෝ සිංහල/දෙමළ වාග් විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති ශාස්ත්‍රවේදී උපාධිය |
| 2 | ඉංග්‍රීසි | X | X | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉංග්‍රීසි භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හදාරා ඇති උපාධියක් හෝ ශාස්ත්‍රවේ දී (ඉංග්‍රීසි) විශේෂ උපාධිය TESL (Teaching English as a second Language) හෝ HND ඉංග්‍රීසි සමග ඕනෑම උපාධියක් |
| 3 | නැටුම් (දේශීය) | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් නර්තන විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (නර්තනය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 4 | සංගීතය (පෙරදිග) | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් පෙරදිග සංගීතය විෂයය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (පෙරදිග සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 5 | සංගීතය (අපරදිග) | √ | √ | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් අපරදිග සංගීතය විෂය ඇතුළත්වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (අපරදිග සංගීතය) උපාධිය හෝ ප්‍රාසාංගික කලාවේදී (විශේෂ) උපාධිය |
| 6 | විද්‍යාව | √ | √ | √ | ජීව විද්‍යාව /රසායන විද්‍යාව/භෞතික විද්‍යාව ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 7 | චිත්‍ර | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රධාන විෂයයක් වශයෙන් චිත්‍ර කලා විෂය ඇතුළත් වන ලලිත කලාවේදී උපාධිය / සෞන්දර්යය උපාධිය හෝ ශාස්ත්‍රවේදී විශේෂ (චිත්‍ර) උපාධිය |
| 8 | ගණිතය | √ | √ | √ | ශුද්ධ ගණිතය /ව්‍යවහාරික ගණිතය /සංයුක්ත ගණිතය ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති විද්‍යාවේදී සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 9 | බුද්ධ ධර්මය | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ බුද්ධාගම/බෞද්ධ ශිෂ්ටාචාරය විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 10 | බෞද්ධ ශිෂ්ටාචාරය | √ | X | X | බෞද්ධ ශිෂ්ටාචාරය ,බෞද්ධ සංස්කෘතිය ,බෞද්ධ අධ්‍යයනය, බෞද්ධ දර්ශනය සහ පාලි යන විෂයයන්ගෙන් එක් විෂයයක් සහිතව පිළිගත් විශ්ව විද්‍යාලයකින් උපාධියක් සමත් වීම. |
| 11 | හින්දු | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ හින්දු ආගම ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 12 | හින්දු ශිෂ්ටාචාරය | X | √ | X | හින්දු ශිෂ්ටාචාරය ,හින්දු ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |

| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 13 | ඉස්ලාම් | √ | √ | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉස්ලාම් විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 14 | ඉස්ලාම් ශිෂ්ටාචාරය | X | √ | X | ඉස්ලාම් ශිෂ්ටාචාරය ,ඉස්ලාම් ධර්මය විෂයය සහිත සාමාන්‍ය හෝ විශේෂ උපාධියක් ලබා තිබීම. |
| 15 | රෝමානු කතෝලික | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ රෝමානු කතෝලික විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 16 | ක්‍රිස්තියානි | √ | X | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ක්‍රිස්තියානි විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 17 | භූගෝල විද්‍යාව | √ | √ | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ භූගෝල විද්‍යාව විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය |
| 18 | පුරවැසි අධ්‍යයනය | √ | √ | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ප්‍රජා පාලනය හා පුරවැසි අධ්‍යාපන විෂයය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය හෝ මානව විද්‍යාව (විශේෂ) උපාධිය |
| 19 | ව්‍යාපාර හා ගිණුම්කරණය | √ | √ | √ | වාණිජවේදී උපාධිය/වාණිජ විෂයය ධාරාවට අයත් විද්‍යාවේදී උපාධිය /වාණිජ විෂයය ධාරාවට අයත් කළමනාකරණවේදී උපාධිය / වාණිජ විෂය ධාරාවට අයත් ඕනෑම උපාධිය |
| 20 | ව්‍යවසායකත්ව අධ්‍යයනය | √ | X | X | |
| 21 | කොරියන් | √ | X | X | කොරියන් භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස ලබා ඇති සාමාන්‍ය හෝ විශේෂ උපාධිය |
| 22 | දෙවන බස (දෙමළ) | √ | X | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ උපාධියට දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබීම සහ අ.පො.ස (සා/පෙළ) විභාගයේ දී හර විෂයයක් ලෙස සිංහල භාෂාවට සම්මාන සාමාර්ථයක් ලබා තිබීම හෝ සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ උපාධියට දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස සමත්ව තිබීම හා පිළිගත් විශ්වවිද්‍යාලයක හෝ රජයේ ව්‍යවස්ථාපිත ආයතනයක මාස 06කට නොඅඩු සිංහල භාෂාව පිළිබඳ ඩිප්ලෝමාවක් හදාරා සහතිකයක් ලබා තිබීම. |
| 23 | සාහිත්‍ය රසාස්වාදය (සිංහල /දෙමළ /ඉංග්‍රීසි) | √ | √ | √ | සිංහල පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ සිංහල ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම /දෙමළ පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ දෙමළ ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම/ඉංග්‍රීසි පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ ඉංග්‍රීසි ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 24 | සාහිත්‍ය රසාස්වාදය (අරාබි) | X | √ | X | අරාබි විෂයය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ අරාබි ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 25 | තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය | √ | √ | √ | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ තොරතුරු තාක්ෂණය විෂයය ප්‍රධාන විෂයය ලෙස හදාරා ඇති තොරතුරු තාක්ෂණය පිළිබඳ උපාධිය (IT), පරිගණක විද්‍යාව පිළිබඳ උපාධිය (Bsc.(Computer Science) |
| 26 | ජලජ ජීව සම්පත් තාක්ෂණය | √ | X | X | කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදී ඕනෑම උපාධියක් හෝ සත්ත්ව පාලනය හා මත්ස්‍ය විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ජලජ සම්පත් කළමනාකරණය හා සත්ත්ව විද්‍යාව පිළිබඳ විද්‍යාවේදී උපාධිය හෝ ඕනෑම විද්‍යාවේදී උපාධියකදී මුළු විෂය සන්ධාරයෙන් 1/3 ක් අවම වශයෙන් ජලජ ජීව සම්පත් තාක්ෂණය විෂයෙන් සම්පූර්ණ කර තිබීම. |

| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 27 | ශිල්ප කලා | √ | X | X | දෘශ්‍ය කලා විශේෂ උපාධිය (චිත්‍ර, මූර්ති, මුද්‍රණ කලා, රෙදිපිළි හා රෙදිපිළි ආශ්‍රිත කලා ආදී) හෝ දෘශ්‍ය කලා හා සැලසුම්කරණය විශේෂ උපාධිය (චිත්‍ර කලා සහ ග්‍රැෆික්) හෝ දෘශ්‍ය හා තාක්ෂණ කලා විශේෂ උපාධිය හෝ ශාස්ත්‍රවේදී හෝ ලලිත කලාවේදී විශේෂ උපාධිය ලබා තිබීම (චිත්‍ර කලා/ග්‍රැෆික්/මූර්ති/දෘෂ්‍ය හා තාක්ෂණික කලා යන විෂයයන් හෝ එක් විෂයයක් හෝ ප්‍රධාන ලෙස හදාරා තිබිය යුතුය). |
| 28 | ගෘහ ආර්ථික විද්‍යාව | √ | √ | X | ගෘහ ආර්ථික විද්‍යාව සාමාන්‍ය පෙළ A සාමර්ථයක් හෝ අ.පො.ස. උසස් පෙළ ගෘහ ආර්ථික විද්‍යා විෂය සඳහා සම්මාන සාමර්ථයක් සහිතව සමත් වී තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක උපාධිධරයකු වීම හෝ ගෘහ ආර්ථික විද්‍යාව සඳහා තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි වෘත්තීය පුහුණු ආයතනයකින් අවුරුද්දකට නොඅඩු පාඨමාලාවක් හදාරා ඩිප්ලෝමාව හෝ සහතික පත්‍රය ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන ඕනෑම විෂය ක්ෂේත්‍රයක් යටතේ උපාධිධරයකු වීම හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ගෘහ විද්‍යාව විෂය සඳහා උපාධිධරයකු වීම. |
| 29 | ප්‍රායෝගික හා තාක්ෂණික කුසලතා | √ | √ | X | අ.පො.ස උසස් පෙළ විද්‍යාව, ගණිතය, තාක්ෂණවේදය විෂය ධාරාවෙන් අවම වශයෙන් විෂයයන් 03ක් සමත් වී තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් උපාධිධරයකු වීම. |
| 30 | නිර්මාණකරණය හා තාක්ෂණවේදය | √ | X | X | අදාළ විෂය ක්ෂේත්‍රයේ තාක්ෂණවේදී/ඉංජිනේරු උපාධිය ලබා තිබීම හා පාඨමාලා අන්තර්ගතයෙන් අවම වශයෙන් 1/3 ක් විෂයානුබද්ධ හැදෑරීම් සහිත වීම හෝ ජාතික තාක්ෂණ සහතික පත්‍රය, ජාතික උසස් තාක්ෂණ ඩිප්ලෝමාව හෝ තෘතීක හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාවේ ලියාපදිංචි ආයතනයක ඊට සමාන්තරව එක් අවුරුද්දකට නොඅඩු විෂයානුබද්ධ කාර්මික ක්ෂේත්‍රයේ පාඨමාලාවක් හදාරා ඊට අදාළ සහතිකය ලබා තිබීම හා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හෝ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය විසින් පිළිගනු ලබන විශ්වවිද්‍යාලයක ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් උපාධිධරයකු වීම. |
| 31 | සෞඛ්‍ය හා ශාරීරික අධ්‍යාපනය | √ | √ | √ | විද්‍යාවේදී (ශාරීරික අධ්‍යාපනය) ගෞරව උපාධිය හෝ ක්‍රීඩා විද්‍යාව හා කළමනාකරණය පිළිබඳ විද්‍යාවේදී ගෞරව උපාධිය ලබා තිබීම. |
| 32 | සන්නිවේදන හා මාධ්‍ය අධ්‍යයනය | √ | √ | X | සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ ) උපාධියක් හෝ සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 33 | ගිණුම්කරණය | √ | √ | √ | ගිණුම්කරණය පිළිබඳ විශේෂ උපාධියක් හෝ ගිණුම්කරණය ප්‍රධාන විෂයයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 34 | ව්‍යාපාර අධ්‍යයනය | √ | √ | √ | ව්‍යාපාර අධ්‍යයනය හෝ ව්‍යාපාර කළමනාකරණයට අදාළ විෂයක් ප්‍රධාන විෂයක් වන ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 35 | ව්‍යාපාර සංඛ්‍යානය | √ | X | X | ව්‍යාපාර සංඛ්‍යානය ප්‍රධාන විෂයක් වන හෝ සංඛ්‍යානය විෂය ඇතුළත් වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම. |

| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 36 | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය | X | √ | X | තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ දර්ශනය පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ තර්ක ශාස්ත්‍රය හා විද්‍යාත්මක ක්‍රමය ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 37 | ආර්ථික විද්‍යාව | √ | √ | √ | ආර්ථික විද්‍යාව පිළිබඳ විශේෂ උපාධියක් හෝ ආර්ථික විද්‍යාව ප්‍රධාන විෂයක් වන වෙනත් ඕනෑම උපාධියක් ලබා තිබීම. |
| 38 | දේශපාලන විද්‍යාව | √ | √ | √ | දේශපාලන විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධියක් හෝ දේශපාලන විද්‍යාව ප්‍රධාන විෂයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 39 | යාන්ත්‍රික තාක්ෂණය | √ | X | X | යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ උපාධිය හෝ යාන්ත්‍රික තාක්ෂණය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ විද්‍යාවේදී උපාධිය. |
| 40 | විදුලි ඉලෙක්ට්‍රොනික හා තොරතුරු තාක්ෂණය | X | √ | X | උපාධියට හදාරනු ලැබූ මුළු විෂයය සංධාරයෙන් මීට අදාළ විෂයයන් අවම වශයෙන් 1/3 ක් සම්පූර්ණ කරන ලද උපාධිය. |
| 41 | පුස්තකාල | √ | √ | X | පුස්තකාල විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රවේදී (විශේෂ) උපාධිය හෝ පුස්තකාල විද්‍යාව ප්‍රධාන විෂයයක් වන ඕනෑම ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධියක් ලබා තිබීම. |
| 42 | ශිෂ්‍ය උපදේශනය | √ | √ | √ | මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව විශේෂවේදී උපාධියක් ලබා තිබීම හෝ මනෝ විද්‍යාව/සමාජ විද්‍යාව පිළිබඳව සාමාන්‍යවේදී උපාධියක් ලබා තිබීම හෝ ඕනෑම උපාධියක් සමග,<br><br>(අ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබා ගත් එක් අවුරුද්දකට නොඅඩු උපදේශනය පිළිබඳව ඩිප්ලෝමා පාඨමාලාවක්,<br><br>*හෝ*<br><br>(ආ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයකින් හෝ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධි පිරිනැමීමේ ආයතනයකින් හෝ තෘතීය අධ්‍යාපන කොමිෂන් සභාවේ අනුමැතිය ලත් ආයතනයකින් ලබා ගත් උපදේශනය පිළිබඳ වසරකට නොඅඩු පශ්චාත් උපාධි ඩිප්ලෝමාවක් ලබා තිබීම. |
| 43 | සිංහල | √ | X | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය. |
| 44 | සිංහල භාෂාව හා සාහිත්‍ය | √ | X | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ සිංහල භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය. |
| 45 | දෙමළ භාෂාව හා සාහිත්‍ය | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය. |
| 46 | දෙමළ | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ දෙමළ භාෂාව ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය. |

| | | සිංහල | දෙමළ | ඉංග්‍රීසි | සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 47 | ඉතිහාසය | X | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉතිහාසය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය. |
| 48 | ඉතිහාසය (ඉන්දියානු/ යුරෝපා/නූතන ලෝක). | √ | √ | X | සම්පූර්ණ අධ්‍යයන කාලය තුළ ඉතිහාසය ප්‍රධාන විෂයයක් ලෙස හැදෑරූ ශාස්ත්‍රවේදී උපාධිය. |

තිලක් සෙනරත්,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව (බ.ප).

2023 සැප්තැම්බර් මස 22 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

*ආදර්ශ අයදුම්පත*

(යොමු අංකය)

බස්නාහිර පළාතේ පළාත් සභා පාසල්වල පවතින සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යය ගුරු පුරප්පාඩු සඳහා උපාධිධාරීන් ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ 1 (අ) ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2023 (අදියර II)

**Open Competitive Examination for Recruitment of Graduates to Grade I (A) of Class 3 of the Sri Lanka Teachers' Service for Sinhala' Tamil and English Medium Vacancies existing in Western Province Provincial Schools - 2023 (Stage II)**

1. භාෂා මාධ්‍යය :..........................................................................................

2. ජාතික හැඳුනුම්පත් අංකය :..........................................................................................

3. උපන් දිනය :.......................................................................................... 3.1 වයස (2023.10.09 දිනට) :...............................................

4. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :..........................................................................................
(ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය විභාගය සඳහා පෙනී සිටින දිස්ත්‍රික්කය ලෙස සලකනු ලැබේ.)

5. බස්නාහිර පළාත තුළ 2023.10.09 දිනට අඛණ්ඩ ස්ථිර පදිංචිය : අවුරුදු :....................... මාස :....................... දින :.......................

6. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :..........................................................................................

7. විභාගය සඳහා ගෙවීම කළ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා කුවිතාන්සියේ අංකය :................................. බ. ප. 1 :.............................

| මුදල් ගෙවන ලද කුවිතාන්සියේ මුල් පිටපත නොගැලවෙන පරිදි මෙහි අලවන්න. |
|---|

8. සම්පූර්ණ නම (සිංහලෙන්) :..........................................................................................

   8.1. සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

   8.2. මුලකුරු සමඟ නම (සිංහලෙන්) :.......................................................................................... මයා /මිය /මෙනවිය

   8.3. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :..........................................................................................

9. ඉල්ලුම් කරනු ලබන විෂයයන් සඳහා උපලේඛන 01 අදාළ කර ගනිමින් උපරිම විෂයයන් 03ක් නම් කරන්න.

9.1.

| අනු අංකය | විෂයය කේත අංකය | විෂයය |
|---|---|---|
| 01. | | |
| 02. | | |
| 03. | | |

10. අයදුම්කරුගේ ස්ථිර ලිපිනය -..................................

10.1. විභාග ප්‍රවේශ පත්‍ර එවිය යුතු ලිපිනය - .................................

11. තොරතුරු දැනුම් දීම සඳහා භාවිතයේ ඇති ජංගම දුරකථන අංකය -

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | | |

12. විද්‍යුත් තැපැල් ලිපිනය - ..............................................................................

13. අධ්‍යාපන සුදුසුකම්. - අ.පො.ස (සා/පෙළ) ප්‍රතිඵල ඃ

| අ.පො.ස. (සා.පෙළ) විභාගය ඃ | | | | | |
|---|---|---|---|---|---|
| වර්ෂය ...........<br>වර්ෂය ........... | | | විභාග අංකය .......................<br>විභාග අංකය ....................... | | |
| විෂයය | සාමර්ථය | වර්ෂය | විෂයය | සාමර්ථය | වර්ෂය |
| 1. | | | 6. | | |
| 2. | | | 7. | | |
| 3. | | | 8. | | |
| 4. | | | 9. | | |
| 5. | | | 10. | | |

14. අ.පො.ස (උ/පෙළ) ප්‍රතිඵල ඃ

| වර්ෂය ............................ | විභාග අංකය ............ |
|---|---|
| විෂයය | සාමාර්ථය |
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

15. උසස් අධ්‍යාපන සුදුසුකම් පිළිබඳ විස්තර ඃ

15.1 උපාධිය ඃ- ..........................................................................................................

15.2 නිකුත් කළ විශ්වවිද්‍යාලය ඃ- ......................................................................................

15.3 උපාධිය වලංගු දිනය ඃ-..................................................................................................

15.4 උපාධියට හදාරා ඇති ප්‍රධාන විෂයය/විෂයයන් ඃ- ..................................................

15.5 උපාධිය ලබා ඇති මාධ්‍යය ඃ- ......................................................................................

(පහතින් දක්වා ඇති කොටස්වල තොරතුරු අයදුම්කරු තම අත් අකුරින් සම්පූර්ණ කළ යුතු වේ.)

16. අයදුම්කරු රජයේ සේවයේ යෙදී සිටියදී අයදුම් කරන්නේ නම්,

16.1 දැනට දරන තනතුර -..............................................................................

16.2 එම තනතුරට පත් කළ දිනය -..............................................................

16.3 ආයතන ප්‍රධානියාගේ නිල නාමය-.......................................................

16.4 සේවය කරන ආයතනය-.........................................................................

16.5 ආයතනයේ ලිපිනය -..............................................................................

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය බව ප්‍රකාශ කරමි. මා මෙම තනතුරට තෝරාගනු ලැබීමෙන් පසුව නුසුදුසු බව අනාවරණය වුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත්වන බව ද දනිමි. මෙහි සඳහන් කිසිඳු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

මුලකුරු සමඟ අයදුම්කරුගේ නම - .....................................................................................................
ලිපිනය - .....................................................................................................
අයදුම්කරුගේ අත්සන - .....................................................................................................
දිනය - .....................................................................................................

---

17. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ................................................................................ මහතා/මහත්මිය/මෙනවිය, මා පෞද්ගලිකව හඳුනන බව ද, ඔහු/ඇය මා ඉදිරිපිට දී ............................. දින ඔහුගේ/ ඇයගේ අත්සන තැබූ බව ද සහතික කරමි.

.....................................................,
අත්සන සහතික කරන නිලධාරිගේ අත්සන.

දිනය :......................................................

සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම ................................................................
තනතුර ........................................................
ලිපිනය ........................................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

---

18. *අයදුම්කරු රජයේ සේවකයකු නම් දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය :*

....................................................................................................මහතා/මහත්මිය/මෙනවියගේ ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කරමි. ඔහු/ඇය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ ස්ථිර/තාවකාලික/අනියම් සේවකයකු/සේවිකාවක වශයෙන් සේවය කරන බවත්, මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත් දන්වමි.

.....................................................................,
දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ බලය පවරනු
ලැබූ නිලධාරියාගේ අත්සන.

දිනය : .................................
තනතුර : ................................
අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුව : .....................................
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)

09-464

## සංශෝධනයයි

### වයඹ පළාත් සහා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

වයඹ පළාත් සභා පාසල්වල පවතින ශ්‍රී ලංකා ගුරු සේවයේ 3 පන්තියේ I (අ) ශ්‍රේණියේ පුරප්පාඩු සඳහා දිස්ත්‍රික් පදනම මත උපාධිධාරීන් බඳවා ගැනීම සඳහාවන තරග විභාගය - 2023

ඉහත සඳහන් තනතුර සඳහා බඳවා ගැනීමට අදාළ ව 2023.09.01 දින අංක 2348 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද 09-141 නිවේදනයේ 8.4 ඡේදයේ (අ) වගන්තිය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

8.4 *සම්මුඛ පරීක්ෂණය* :

මෙම ගැසට් නිවේදනයේ සඳහන් සුදුසුකම් සපුරා තිබේදැයි පරීක්ෂා කිරීම, කායික හා මානසික යෝග්‍යතාවය පරීක්ෂා කිරීම, උපාධි පන්ති සාමාර්ථ හා අමතර සුදුසුකම් සඳහා ලකුණු ලබාදීම පිණිස මෙම සම්මුඛ පරීක්ෂණය පවත්වනු ලැබේ. අදාළ සම්මුඛ පරීක්ෂණය සඳහා ලිඛිත විභාගයෙහි ලකුණු ප්‍රමුඛතාවය අනුව පුරප්පාඩු සංඛ්‍යාව මෙන් තුන් ගුණයක් කැඳවනු ලැබේ. සම්මුඛ පරීක්ෂණය සඳහා පැමිණීමේ දී විස්තරාත්මක උපාධි සහතිකය ඉදිරිපත් කළ යුතු වේ.

(අ) පන්ති සාමාර්ථය සඳහා ලකුණු ලබා දීම (උපරිම ලකුණු 07)

| | |
|---|---|
| I පන්තිය | ලකුණු 07 |
| II පන්තිය ඉහළ පෙළ | ලකුණු 05 |
| II පන්තිය පහළ පෙළ | ලකුණු 03 |

මෙම තනතුරට බඳවා ගැනීම සඳහා වන අංක 2348 හා 2023.09.01 දිනැති *ගැසට්* නිවේදනයේ සඳහන් අනෙකුත් විධිවිධාන එලෙසින් ම බල පැවැත්වේ.

වයඹ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

ඊ. එම්. පී. ඒකනායක,
ලේකම්,
පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
වයඹ පළාත.

2023 සැප්තැම්බර් මස 21 වැනි දින,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
වයඹ පළාත.

09-558

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.